**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය - 2022**

---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මහලේකම් කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහලේකම් කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහලේකම් කාර්යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 විධිවිධාන වලින් බැහැරව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල සඳහා වැඩිහිටි දීමනාවෙන්, අරමුදලේ බැරට ලබාගත යුතු දායක මුදල , මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් අරමුදල ආරම්භ කළ 2016 වර්ෂයේ සිට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව රු.75,431,300 ක අරමුදලට අදාල දායක මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | පෙර වර්ෂවල මුදල් පදනම මත සමාජ ආරක්ෂණ දායක මුදල් ගිණුම්වල පෙන්වා තිබුණද 2022 මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල එය උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. වර්ෂයට අදාලව දායක මුදල් ආදායම් ලෙසත් ලැබිය යුතු ප්‍රමාණය ජංගම වත්කම් ලෙසත් වර්ග කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇති බව දන්වමි. | ලැබිය යුතු දායක මුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කලයුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 228075 දරන සමාජ ආරක්ෂණ අරමුදලේ බැංකු ජංගම ගිණුමේ මුදල් පොතේ වැරදි ලෙස රු.163,214 ක මුදලක් බැංකු සැසඳුමේ ඉදිරියට ගෙන විත් තිබුණි. එකී තැන්පත් නොකළ මුදල් හෝ මුදල් ඌනතාවය සම්බන්ධයෙන් මාස 30 | මේ සම්බන්ධව ලබාගත් තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නිරවුල් කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත් මේ සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලබන බව | මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලයක් ඉකුත් වී තිබුණද නිරවුල් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මහලේකම් කාර්යාලයේ කාර්යය සාධන වාර්තාව පිළියෙල කර මුද්‍රා ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාල කාර්යය සාධනය මේ වනවිට සකස් කරමින් පවතින අතර, ඉදිරියේදී එම වාර්තාව ලබා දීමට කටයුතු කරමි. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂ 07 ක කාලය තුල ලබාදී තිබුණු රජයේ ප්‍රදාන වලින් උපයෝජනය නොකල අරමුදල් බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකල රු. 6,137,005 ක් වූ අතර ඉකුත් වර්ෂ 07ක කාලය තුල රු.3,201,322 සිට රු.15,001,302 දක්වා පරාසයක වූ මුදල් ශේෂයක් උපයෝජනය කිරීමකින් තොරව බැංකු ජංගම ගිණුමේ රඳවා තිබුණි. 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 19 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අතිරික්ත මුදල් ජාතික සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී රාජ්‍ය වියදම් සීමා කිරීම යටතේ ඇතැම් වැඩිහිටි සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් ඒ සඳහා ලැබුණු මුදල්වලින් කොටසක් මෙසේ වර්ෂය අවසානයේ ඉතිරි වී පැවතිණි. කෙසේ නමුත් මෙම මුදල් 2023 වර්ෂයේ ආරම්භයේදී වැඩසටහන් සඳහා වියදම් කල බව කාරුණිකව දන්වමි. | භාණ්ඩාගාරය විසින් ලබාදෙන ප්‍රතිපාදන ඵලදායි කටයුතු වෙනුවෙන් යොදාගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 213,698 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 841,077 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 627,379 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සේවක පිරිවැය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අඩු ආදායම්ලාභී වැඩිහිටි ප්‍රජාවගේ විශේෂ හා හදිසි අවස්ථාවලදී සෞඛ්‍ය , පෝෂණය හා ආරක්ෂණ වැය දැරීම හා වැඩිහිටියන්ගේ සුභසාධනය අරමුණු කර වැඩිහිටි දීමනාව ලබන ප්‍රතිලාභීන්ගෙන් , එක් ප්‍රතිලාභියෙකුගෙන් මාසිකව රු.100 බැගින් වැඩිහිටි දීමනාවෙන් අයකර වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධියට පත්කර පාර්ලිමේන්තු පනතක් මඟින් නෛතික භාවයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීමට මුල් වන 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුව නීත්‍යානුකූලව පිළිගැනීම ලැබීම තුළින්ම මෙම අරමුදලෙහි වලංගුභාවය, නීත්‍යානුකූලභාවය හා විනිවිදභාවය ප්‍රකාශ වී ඇත. | පාර්ලිමේන්තු පනතක් මඟින් නෛතික භාවයක් ඇති කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සඳහා ගෙවනු ලබන වැඩිහිටි දීමනාවෙන් , 2016 ජනවාරි සිට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව රු.2,902,192,100 ක් ලබාගත යුතුව තිබුණ ද , අයකරගෙන තිබුණේ රු.2,826,192,800 ක් පමණි. ඉතිරි රු.75,999,300 ක් වූ හිඟ මුදල අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | එලෙස මාසිකව අවකරණ මුදල් නොඑවන, ගෙවීම් ප්‍රමාද කරන කාර්යාලවලට සිහිකැඳවීම් යවා ඇති අතර 2022 වර්ෂයට අදාලව මේ දක්වා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02ක් හැර ඉතිරි මුදල් සියල්ල අයකර ගෙන ඇත. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට රැස්කරන මුදල් වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය, අයිතිවාසිකම් ප්‍රවර්ධනය, වැඩිහිටියන් සවිබල ගැන්වීම, | සමාජ ආරක්ෂණ අරමුදලේ ප්‍රථම ක්‍රියාකාරි සැලැස්ම සකස් කර අනුමත කරගනු ලැබුවේ 2019 වර්ෂයේදී වන බැවින් 2017, 2018 වර්ෂවල එම | අරමුදලේ කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂා කිරීම සඳහා වූ අරමුදලේ කාර්යයන් ඉටු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 06 ක කාලය තුල අරමුදලට මුදල් බැර කිරීම රු.මිලියන 444.48 සිට රු.මිලියන 546.42 ක පරාසයක් ගනු ලැබුවද එකී කාලය තුල වැය දැරීමකින් තොරව රඳවා ගත් මුදල රු.මිලියන 444.48 සිට රු.මිලියන 202 දක්වා පරාසයක පැවතුණි. | අරමුදලට අදාල වැඩිහිටි සුබසාධක වැඩසටහන් ක්‍රියාත්මක නොවීය. තවද 2020 සහ 2021 වර්ෂවල පැවති කොවිඩ් වසංගත තත්වය හා 2020 වර්ෂයේ පැවති ආර්ථික ගැටලු හමුවේ භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 03/2022 චක්‍රලේඛය පරිදි වැඩසටහන් තාවකාලිකව අත්හිටවූ බැවින් සමාජ ආරක්ෂණ අරමුදලේ වැඩසටහන්ද 2022 අප්‍රේල් 26 දිනෙන් පසුව සිදු නොවුනි. | |
| (ඇ) | 2018 - 2022 වර්ෂ 05 ක කාලය තුල වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට ලබාගෙන තිබුණු දායක මුදල් වලින් වැඩිහිටියන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා උපයෝජනය නොකල රු.මිලියන 1,476.15 සිට රු.මිලියන 2,941.70 ත් අතර මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. ඒ අනුව වසර ගණනාවක් පුරා වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලේ රෙගුලාසි ප්‍රකාරව, අරමුදලේ කාර්යයන් ඉටුකිරීමට නොයොදවා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | අතිරික්ත මුදල් ජාතික සභාවේ පූර්ව අනුමැතිය ඇතිව රාජ්‍ය බැංකු අතරින් ඉහලම පොලි අනුපාතයක් ලබා දෙන බැංකුවෙහි විශේෂ පොලි අනුපාත (සාමාන්‍ය පොලි අනුපාතයට වඩා ඉහල) යටතේ මෙම ආයෝජන සිදුකර ඇති බවත් ඉන් ලැබෙන පොලි ආදායම මගින් අරමුදල තවත් ශක්තිමත් වී ඇති බවත් කාරුණිකව දන්වමි. | දායක මුදලින් වැඩිහිටියන්ට ප්‍රතිලාභ ලබාදී ඉතිරිය පමණක් ආයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයට අයත් ජීප් රථය එම අමාත්‍යාංශයේ ධාවන කාලයේදී සිදුකළ අලුත්වැඩියා වෙනුවෙන් මහ ලේකම් කාර්යාලය විසින් අවිධිමත් ලෙස රු.1,585,521 ක් දරා තිබුණද ප්‍රමාණවත් ලෙස ධාවනයට යෙදවීම වෙනුවෙන් ජීප් රථය රඳවාගැනීමට හෝ වැයකළ අලුත්වැඩියා වියදම අයකර ගැනීමට හෝ කටයුතු නොකර, ජීප් රථය ආපසු භාරදීම තුලින් මහලේකම් කාර්යාලයට රු.1,585,521 ක පාඩුවක් සිදු වී තිබුණි. වර්ෂ 03 කට ආසන්න කාලයක් ඉකුත් වී තිබුණ ද , මහලේකම් කාර්යාලය විසින් දැරූ | මෙම මොන්ටේරෝ රථය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ සංචිත වාහන වලට ගනු ලැබු අතර, පසුව කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශයට වාහනය නැවත බාර දුනි. 2021 ජනවාරි 27 දින වැයවූ මුදල් කඩිනමින් ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා අමාත්‍යාංශය වෙත ලිපියක්ද යොමු කර ඇති අතර, මේ වනතෙක් ඒ සඳහා ප්‍රතිචාර නොදක්වා ඇති බව දන්වා සිටිමි. | වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කලයුතුය. |

වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තිය විධිවිධාන පරිදි නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් නිසි ලෙස සකසන ලද යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබුණි. | අප ආයතනයේ නිල වෙබ් අඩවියේ මා විසින් නිරාවරණය කරන ලද මෘදුකාංග පද්ධතියක් තුළින් වාර්තාගත ක්‍රම ඔස්සේ රු.2,000/- දීමනාව සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් යාවත්කාලීන වන වැඩිහිටි දත්ත තොරතුරු පද්ධතියක් උඩුගත කර ඇත. ඊට අමතරව විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරිම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, අභිමානය ආරක්ෂා කිරීම යනාදී ප්‍රධාන කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේද යන්න පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු කිරීමට අදාල පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී ද අවධානය යොමු වී නොතිබුණි. | එවකට රටේ පැවති කොරෝනා වසංගත තත්වය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් රජය ගනු ලැබූ ප්‍රතිපත්ති යටතේ වර්ෂයේ පසුවිපරම් කටයුතු සිදු කිරිම සීමා කිරීමට සිදු විය. | ප්‍රධාන කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේද යන්න පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා 2016 වර්ෂයේදී රජයේ වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන මත රු.4,245,807 කින් රු.2,438,715 ක් වැය කර ඇතත් ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු මේ දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතිරි රු.1,807,092 ක් වූ මුදල පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 06 ක පමණ කාලයක සිට නිශ්කාර්යව රඳවාගෙන තිබුණි | 2016 වර්ෂයේ කෙටුම්පත් කරන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ප්‍රතිපත්තියේ අතුලත් කරුණු 2022 වර්ෂයේ උපාය මාර්ගික සැලැස්ම අනුව සකස් කරන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ප්‍රතිපත්තියට ඇතුලත් කර නව ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස 2023 මැයි 29 වන දින පවත්වන ලද රැස්වීමේදී උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව නැවත සකස් කරන ලද ප්‍රතිපත්ති මාලාව අවශ්‍යතාවය මත වෙනස්කම් සිදු කරමින් පවතී. | වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම කඩිනම් කිරීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටි පුරවැසියන් වෙත මාසිකව රු.2,000 ක දීමනා ගෙවීමට අදාලව වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000 ක මාසික දීමනාවක් ගෙවීමේදී දීමනාලාභීන් පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තා වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර දීමනාලාභීන් සංඛ්‍යාව, ගෙවූ දීමනා වටිනාකම් හා මාසය තුල ගෙවීම් නොකල ප්‍රතිලාභීන් පිළිබඳව විස්තර, යනාදිය ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට වැඩිහිටි මහලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී විගණනය විසින් දක්වා ඇති පරිදි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. | මාසික දීමනාවක් ගෙවීමේදී දීමනාලාභීන් පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තා පවත්වා ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ගණයේ කාර්යමණ්ඩලය වූ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන ) , සහකාර අධ්‍යක්ෂ (පාලන) ,නීති නිලධාරී, සහකාර | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙනුවෙන් 2009 ඔක්තෝබර් 22 දින | දීර්ඝ කාලීනව පුරප්පාඩු පවතින ප්‍රධාන තනතුරු කාර්යය සඳහා බඳවා ගැනීමට |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ ( තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ) යනාදී ප්‍රධාන තනතුරු දීර්ඝ කාලීනව පුරප්පාඩු පවතින අතර ගණකාධිකාරී තනතුර ද වැඩ බැලීමේ පදනම මත පත් කර තිබුණි. | මණ්ඩලය පළමුවරට අනුමත කර තිබුණද, අදාල තනතුරු සඳහා බඳවාගැනීම් පරිපාටිය අනුමත කර තිබුනේ 2011 ජනවාරි 28 දින වේ. අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු සඳහා ද්විතීයන පදනම මත හෝ වැඩ බැලීමේ පදනම මත හෝ රාජකාරි ආවරණය කිරීමේ පදනම මත වරින් වර රේඛීය අමාත්‍යාංශය විසින් පත් කිරීම් සිදු කර ඇත. | කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වැඩිහිටි සුභ සාධන වැඩසටහන් සඳහා රු. මිලියන 50 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 20.525 ක් වැඩිහිටියන් වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන සුබසාධන වැඩසටහන් වලට නොයොදා ආයතන වියදම් වෙනුවෙන් මාරු කරගෙන තිබුණි. | 2022 වර්ෂයේදී රාජ්‍ය වියදම් සීමාකිරීම මත වර්ෂය ආරම්භයේදී සැලසුම් කර තිබු ඇතැම් වැඩිහිටි සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සීමාවිය. එමෙන්ම අත්‍යවශ්‍ය වියදම් ඉහල යාම හේතුවෙන් වැඩිහිටි මහලේකම් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ආයතන වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැඩිහිටි සුබසාධන වැඩසටහන්වල අතිරික්ත ප්‍රතිපාදන මාරු කර ගැනීම සිදුකල බව දන්වමි. | පරිපාලන වියදම් සීමා කිරිමට කටයුතු කල යුතුය. |
| (ආ) | භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුලදි වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සංශෝධිත ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර තිබූ ක්‍රියාකාරකම් අතුරින් ප්‍රධාන ක්‍රියාකාරකම් 03 ක ප්‍රගතිය ඉතා පහල මට්ටමක පැවතුණි. | 2022 වර්ෂයේදී රාජ්‍ය වියදම් සීමාකිරීම මත වර්ෂය ආරම්භයේදී සැලසුම් කර තිබු ඇතැම් වැඩිහිටි සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සීමාවිය. | සැලසුම් පරිදි අපේක්ෂිත කාර්යයන් සිදු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අරමුදලේ ව්‍යාපෘති/ක්‍රියාකාරකම් නැවත සමාලෝචනය කර කාලානුරූපිව සංශෝධනය විය යුතු ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පවතීනම් ඒවා හඳුනාගෙන 2022 ඇස්තමේනතු සකස් කිරිමේදි සංශෝධනය ඉදිරිපත් කල යුතු වුවත් එසේ කිරීමට කටයුතු නොකර වර්ෂය අවසන් වීමට දින කිහිපයක් තිබිය දී සංශෝධන ඉදිරිපත් කිරීම එලදායි නොවන බව නිරික්ෂණය වේ. එසේම 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ද අනුව ඉලක්කගත කාර්යය සාධනය ලගාකර ගැනීමට අපොහොසත් වීම මත ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරිමට කටයුතු කර තිබුණි. | 2022 අප්‍රේල් 26 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා වැඩසටහන් නතර කරන ලදී. පසුව වර්ෂ අවසානයේදී ලැබුනු ඉල්ලීම් පදනම් කරගනිමින් වැඩසටහන්වල අවශ්‍යතාවය මත ක්‍රියාකාරී සැලැස්මේ සංශෝධනයන් කිරීමට කටයුතු කරන ලදී. | ක්‍රියාකාරී සැලැස්ම කාලානුරූපිව සංශෝධනය විය යුතුය. |